# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## විදුලි සංදේශ නිලධාරි II ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීම (අභ්‍යන්තර පදනම)

**ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

- සංඛ්‍යාත බාධාවීම් ( Interference Measurement) , ක්ෂේත්‍ර තීව්‍රතා(field strength )සහ ප්‍රතිදාන බලය පිළිබඳ මිනුම් (Power Measurements )පිළිබඳ රාජකාරි.
- තාක්ෂණික පරීක්ෂණ පැවැත්වීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- තාක්ෂණික ප්‍රමිතීන් සහ අනුකූලතා පරීක්ෂණ පැවැත්වීම.
- මිනුම් සහ පරීක්ෂණ උපකරණ නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමෙහි ලා කළමනාකාරිත්වයට සහාය වීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් පිරිනමනු ලබන NVQ 5 මට්ටමට හෝ SLQF 3 මට්ටමට නොඅඩු ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ කටුබැද්ද ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ ඊට සමාන හෝ උසස් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආශ්‍රිත/මෙහෙයුම්/කළමනාකරණ සහකාර/තාක්ෂණ හෝ ප්‍රාථමික මට්ටමේ තනතුරක ස්ථිර පදනම මත වසර 04ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. තරඟ විභාගයේ සමස්ථ ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ. (I) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය (II) තනතුරට අදාළ විෂයය දැනුම ලිඛිත විභාගයේ විෂයයන් වේ .

**(4) වැටුප :-** TRC 5.2 -Rs. 54400 (10x1020) -(10x1360)-(10x1700)-(10x2040) – 115600.

**(5) පොදු කොන්දේසි :**

- තනතුර සඳහා පත් කිරීම් වසරක වැඩ බලන කාලයකට යටත් වේ.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම්/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.

**(6) අයදුම්කිරීමේ ක්‍රමය :**

අ. අයදුම්පතේ පරිලෝකනය කරන ලද (Scanned) පිටපතක් සමග අදාළ අධ්‍යාපන/ වෘත්තීය සහතිකපත් toadd@trc.gov.lk විද්‍යුත් ලිපිනයට එවිය යුතුය.විද්‍යුත් තැපෑලේ මාතෘකාව ‘Recruitment of TO -Grade II - Internal.’ යනුවෙන් සඳහන් කළ යුතුය.

ආ. අයදුම්පතේ මුද්‍රිත පිටපත සහ සහතිකපත් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පෙර පාලන අංශය වෙත භාර දිය යුතුය.

ඇ. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර අවශ්‍යතාවලට අනුකූල නොවන ඒවා ප්‍රතික්ෂේප කෙරේ.

ඇ. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 31.08.2023 වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක.276
ඇල්විටිගල මාවත
කොළඹ 08

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## විදුලි සංදේශ නිලධාරී II ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත)

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

අයදුම්පත්‍රය මෙතැනින් බාගත කර ගන්න

**(7) රැකියා විස්තරය**

- නිරෝධන මැනීම , ක්ෂේත්‍ර ශක්තිය (field strength )සහ බල මිනුම් (Power Measurements )පිළිබඳ කාර්යයන්හී නිරත වීම.
- තාක්ෂණික පරීක්ෂණ පැවැත්වීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- තාක්ෂණික ප්‍රමිතීන් සහ අනුකූලතා පරීක්ෂණ පැවැත්වීම.
- මිනුම් සහ පරීක්ෂණ උපකරණ නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමෙහි ලා කළමනාකාරිත්වයට සහාය වීම.

**(8) අවශ්‍ය අවම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් වෘත්තිය පුහුණු ආයතනයකින් පිරිනමනු ලබන NVQ 5 මට්ටමට හෝ SLQF 3 මට්ටමට නොඅඩු ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ කටුබැද්ද NDT ඩිප්ලෝමාව හෝ ඊට සමාන හෝ උසස් අධ්‍යාපන/වෘත්තිය සුදුසුකමක් ලබා තිබිම.

සහ

අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසු විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 3ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**(9) <u>බඳවා ගැනීමේ පටිපාටිය</u>**

ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. තරඟ විභාගයේ සමස්ථ ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ. (I) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය (II) තනතුරට අදාළ විෂයය දැනුම ලිඛිත විභාගයේ විෂයයන් වේ .

**(10) වැටුප :-** TRC 5.2 - Rs. 54400 (10x1020) -(10x1360)-(10x1700)-(10x2040) – 115600. මෙම තනතුර සඳහා සියලුම නව පත්වීම් මෙම රැකියා කාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

**(11) වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18-45 අතර විය යුතුය.

**(12) පොදු කොන්දේසි :**

- මෙය ස්ථිර පත්වීමක් වන අතර වසර 03 පරිවාස කාලයකට යටත් වේ.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා ඍජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.
- බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**(13) අයදුම්කිරීමේ ක්‍රමය :**

අ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත අදාළ අධ්‍යාපන/ වෘත්තීය / සුදුසුකම් පිළිබද සහතිකවල පිටපත්/ ජීව දත්ත සමග .................. විද්‍යුත් ලිපිනයට එවිය යුතුය. විද්‍යුත් තැපැලේ මාතෘකාව ලෙස 'විදුලි සංදේශ නිලධාරී II ශ්‍රේණියට බඳවා ගැනීම -විවෘත'ලෙස සඳහන් කළ යුතුය.

ආ. අයදුම්පතේ දෘඩ පිටපතක් ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ " විදුලි සංදේශ නිලධාරි තනතුර - II ශ්‍රේණිය / විවෘත " ලෙස සඳහන් කළ යුතුය.

ඇ. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

ඇ. අයදුම්පත් …………………….. දින හෝ එදිනට පෙර එවිය යුතුය.

වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක .276
ඇල්විටිගල මාවත
කොළඹ 08